දුරකථන ) 
தொலைபேசி ) 011-2559250
Telephone ) 011-2368144

ෆැක්ස් )
பெக்ஸ் ) 011-2368583
Fax )

විද්‍යුත් තැපැල )
மின்னஞ்சல் முகவரி )dnutri@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் )www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )PA/NUT/HB/16/2013
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )03/03/2014
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**චක්‍රලේඛ අංක :-** 02-45/2014

සියළුම :-

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්

විශේෂිත සෞඛ්‍ය ඒකක ප්‍රධානින්

රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති සියළු ම සෞඛ්‍ය ආයතන ප්‍රධානින්

රෝහල් අධ්‍යක්ෂ/ වෛද්‍ය අධිකාරි/ දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරි / සෞඛ්‍ය වෛද්‍ය නිළධාරින්

ආයතනභාර වෛද්‍ය නිළධාරින් පර්යන්ත රෝහල්

**ශ්‍රී ලංකාව තුළ නැවුම් කිරි භාවිතය ප්‍රචලිත කිරීම.**

නැවුම් කිරි සහ කිරි නිෂ්පාදන වන යෝගට්, මුදවපු කිරි යනාදිය ශ්‍රී ලංකාවේ අතිතයේ සිට බොහෝ කාලයක් පරිභෝජනය කරනු ලැබ ඇත. නැවුම් කිරි ශ්‍රී ලංකාවේ ස්වාභාවික තණකොළ ආහාරයට ගැනිමෙන් පිවත් වන කිරිදෙනුන්ගෙන් ලබා ගන්නා පෝෂණිය ආහාරයකි. නැවුම් කිරි එළදෙනුන්ගෙන් දොවාගෙන ඉතා කෙටි කලක් තුළ පරිභෝජනය කරන බැවින් එහි අඩංගු පෝෂක සංඝටක වලට වන හානිය අවමය. එබැවින් නැවුම් කිරි වනාහි පෝෂණ ගුණයෙන් අනුන අත්‍යවශ්‍ය මේද අම්ල, ඇමයිනෝ අම්ල, විටමින් සහ ඛණිජ ලවණ අඩංගු ඉතා පෝෂ්‍යදායි ආහාරයකි.

තව ද කිරිපිටි නිපදවිමේදි නොයෙකුත් සෞඛ්‍යයට අහිතකර රසායනික ද්‍රව්‍ය එම කිරිපිටි වලට එකතු විමේ හෝ එකතු කිරීමේ අවදානමක් ඇති බව විවිධ අවස්ථා වලදි වාර්තා වි ඇත. ආනයනය කරන ලද කිරි නිෂ්පාදන නිසා ගැටළු රාශියක් ඇතිවු බව ඉතිහාසය සාක්ෂි දරයි.
උදාහරණ ලෙස,

- 2008 වසරේදි කිරිපිටි වලට මෙලමයින් (melamine) නම් රසායනික ද්‍රව්‍ය එකතු කිරීමෙන් දරුවන් විශාල ප්‍රමාණයක් රෝගි වු අතර වකුගඩු අකර්මන්‍ය වීමෙන් කිහිප දෙනෙක් මිය ගිය බව රටවල් කිපයකින් ම වාර්තා වී ඇත.

- මෑතකදි විදේශ රටවල් කිහිපයක් විසින් ඇතැම් ආනයනික කිරිපිටි වල බොටියුලිනම් (Botulinum) නම් විෂ රසායනය නිපදවන බැක්ටිරියා අඩංගු බවට තහවුරු වු බැවින් ඒවා ආනයනය තහනම් කරන ලදි.

- ශ්‍රී ලංකාවේ ඉතා මෑතකදි ආනයනය කරන ලද කිරිපිටි වල DCD නම් රසායනික ද්‍රව්‍ය අඩංගු වී ඇති බවට වාර්තා වීමෙන් අප රට තුළ මහත් ආන්දෝලනාත්මක තත්ත්වයක් උද්ගත විය.

ගතව ද කිරි නිෂ්පාදන මෙරටට ආනයනය කිරීම සඳහා වාර්ෂිකව විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය වේ. එබැවින් අප රට තුළ නැවුම් කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම තුළින් විශාල විදේශ විනිමයක් ඉතිරි කර ගත හැකි අතර, දේශීය කිරි ගොවීන්ගේ ආර්ථික තත්ත්වය ද ඉහළ නැංවිය හැක.

නැවුම් කිරි භාවිතයේ පෝෂණ හා ආර්ථික ප්‍රතිලාභ ශ්‍රී ලාංකික ජනතාවට ලබා දීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර තිබේ. ඔබ ආයතනය තුළ එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා උපදෙස් ලබාදෙන මෙන් ඉල්ලමි.

01. මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පාදක කොට ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලය නැවුම් දියර කිරි භාවිතයේ වාසි පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන් සංවිධානය කිරීම.

02. ආයතනයේ අවශ්‍යතා සඳහා කිරි ඇණවුම් කිරීමේදී දියර කිරි සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කිරීම.

03. දියර කිරි ගබඩාකර තැබීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

04. ආයතනයේ ආපනශාලාව සහ අනෙකුත් අලෙවි හල්වල දියර කිරි හා මුදවපු කිරි, යෝගට් වැනි ඒ ආශ්‍රිත නිෂ්පාදන සුලබ කිරීම.

05. සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් වලදී දියර කිරි ප්‍රවර්ධනය පිළිබඳ වැඩසටහන් හැකි සෑම අවස්ථාවකදී ම ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

මෙම චක්‍රලේඛය සියළු කාර්ය මණ්ඩලයේ අවධානයට යොමු කොට ඔබ ආයතනය තුළ එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා උපදෙස් ලබාදෙන මෙන් ඉල්ලමි.

..........................................

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක
සෞඛ්‍ය ලේකම්

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් :-

1. අතිරේක සෞඛ්‍ය ලේකම්
2. පළාත් සෞඛ්‍ය ලේකම්
3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
4. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ම.සෞ.සේ.1 හා 11, සෞ.සේ.)
5. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
6. අධ්‍යක්ෂ පවුල් සෞඛ්‍ය සේවා කාර්යාංශය
7. අධ්‍යක්ෂ සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය
8. අධ්‍යක්ෂ නාගරික හා වතු සෞඛ්‍ය
9. අධ්‍යක්ෂ පාරිසරික හා වෘත්තිය සෞඛ්‍ය
10. අධ්‍යක්ෂ වෛද්‍ය පර්යේෂණ ආයතනය
11. අධ්‍යක්ෂ පෝෂණ අංශය
12. අධ්‍යක්ෂ පෝෂණ සම්බන්ධීකරණ අංශය
13. අධ්‍යක්ෂ බෝ නොවන රෝග ඒකකය